**මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම - 2020**

---

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** මතය

මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

-------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ ගණුදෙනු සටහන් කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික හෝ ලේඛණගත නිසි ක්‍රමවේදයක් නොමැත. ඒ වෙනුවට සිදුකරන ගණුදෙනු පොදු ලෙජරයට පිටපත් කිරීමකින් තොරව මූලාශ්‍ර ලේඛණවලින් ඍජුවම මෘදු පැතුරුම්පතක ලේඛනයක් වෙත පිටපත් කර මූල්‍ය ප්‍රකාශන සකස් කරයි. | ස්වයංක්‍රීය ගිණුම්කරණ පැකේජයක් මිලදී ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. එම පද්ධතිය දැනටමත් ස්ථාපනය කර ඇති අතර මෙම වසරේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මෙම පද්ධතිය මගින් සකස් කරනු ලැබේ. | ගණුදෙනු වාර්තා කිරීම සඳහා කළමනාකරණය විසින් නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කල යුතුය. |
| (ආ) | සමාගම ජ'නල් සටහන් මෘදු ආකෘතියෙන් (පැතුරුම්පතක) පවත්වාගෙන ගොස් ඇති අතර එම ජ'නල් සටහන් වගකිවයුතු නිලධාරියෙකුගේ අනුමැතියකින් තොරව සටහන් කර ඇති අතර අනුක්‍රමික අංක රහිතව පවත්වාගෙන ගොස් ඇත. | විගණනයේ නිර්දේශ පරිදි අදාල සටහන් වල දෘඪ පිටපත් නිසි අනුමැතිය සහිතව ගොනු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී ගැනීමට කටයුතු කරනු ලැබේ. | නිසි අනුමැතියක් සහිතව ජනල් සටහන් මගින් ගණුදෙනු වාර්තා කිරීම සඳහා කළමනාකරණය විසින් නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇති කල යුතුය. |
| (ඇ) | සමාගම විසින් සියලුම ගෙවීම් සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ (මව් සමාගම) ගෙවීම් වව්චර උපයෝගී කරගනිමිනි. ස්වාධීන සමාගමක් වශයෙන් වව්චර පිළියෙල කර ගෙවීම් සිදු කිරීමේ ක්‍රමයක් සමාගම තුල ස්ථාපනය කර නැත. | දැනට, සියලුම ගෙවීම් ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ බැංකු ගිණුම් හරහා සිදු කෙරේ. කෙසේ වෙතත් කළමණාකරණ සේවා රක්ෂණ (පෞද්ගලික) සමාගම වෙත මූල්‍ය නිලධාරියෙකු බඳවා ගැනීමෙන් පසු සියලුම ගෙවීම් කළමණාකරණ සේවා රක්ෂණ (පෞද්ගලික) සමාගමේ බැංකු ගිණුම් හරහා සිදු කෙරෙන අතර එම අවස්ථාවේදී කළමණාකරණ සේවා රක්ෂණ (පෞද්ගලික) සමාගම වවුචරය භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ. | කළමනාකාරීත්වය විසින් අනන්‍යවූ ගෙවීම් වවුචර සහිත ගෙවීම් පද්ධතියක් සහ ක්‍රියාකාරී අභ්‍යන්තර පාලන පද්ධතියක් සමාගමට හඳුන්වා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාගමේ සේවකයින්ට ලබාදෙනු ලබන ණය පහසුකම් සහ එහි අයකර ගැනීම් සමාගමේ පොත්වල සටහන් කර නොතිබුණි. ඒ වෙනුවට එම ශේෂයන් මව් සමාගමේ පොත්වල සටහන් කර තිබුණි. **2020** දෙසැම්බර් **31** දිනට අයවිය යුතු සේවක ණය ශේෂ රු. **134,742,311** කි. | මෙය වෙනම සමාගමක් වුවද, බඳවාගන්නා සේවකයින් ඍජුවම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත අනුයුක්ත කර ඇත. එම නිසා ආරම්භයේ සිටම සේවක ණය සඳහා ලංකා රක්ෂණ සමාගම විසින් සිදු කරනු ලබයි. | සේවකයන්ට ලබාදෙන ණය පහසුකම් සේවක ප්‍රතිලාභවල කොටසකි. මේ නිසා සේවකයින්ට ලබාදෙන ණය සමාගමේ ලේඛණ වල සටහන් කළයුතුය. |

**1.5.2** නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා
-----------------------------------------

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.) | වෙනස (රු.) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග ඇති ජංගම ගිණුම | **116,188,025** | **115,305,296** | **882,729** | ගිණුම් අතර සංසන්දනය දැනටමත් ආරම්භ කර ඇති අතර **2021** වර්ෂයේ ගිණුම් අවසාන වීමට පෙර එය නිවැරදි කිරීමට බලාපොරොත්තු වේ. | කළමනාකරණය විසින් මෙම වෙනස්වීම් සඳහා හේතු හඳුනාගෙන කාලීනව නිවැරදි කිරීමට කටයුතු කලයුතුය. |

**1.5.3** විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම
------------------------------------------

| | විෂය | මුදල (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| අ | වෛද්‍යානිවාඩු සඳහා දීමනා ගෙවීම | **20,789,305** | ගෙවීම සඳහා අනුමත කරනලද ආයතනික ප්‍රතිපත්තිය හා අධ්‍යක්ෂමණ්ඩල අනුමැතිය | මෙය ආරම්භයේ සිටම සමාගමේ පරිචයක් ලෙස ක්‍රියාත්මක වූ අතර මානව සම්පත් ප්‍රතිපත්තියට ඇතුලත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ඇත. | කළමනාකරණය විසින් මේ සඳහා නියමිත ප්‍රතිපත්තියක් සකස්කර ගෙවීම සඳහා නිසි පරිදි අධිකාරී බලය ලබාගැනීමට කටයුතු කලයුතුය. |
| ආ | අලුත් අවුරුදු තැගි දීමනාව | **රු.1,215,000** | අලුත් අවුරුදු තැගි දීමනාව ගෙවීම සඳහා අනුමත කරනලද ලිඛිත ආයතනික ප්‍රතිපත්තිය හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය | මෙම ගෙවීම් සිදුකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | කළමනාකරණය විසින් මේ සඳහා නියමිත ප්‍රතිපත්තියක් සකස්කර අදාල පරිදි අධිකාරී බලය ලබාගැනීමට කටයුතු කලයුතුය. |

**1.6** නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1935 වෘත්තීය සමිති ආඥා පනතේ 8(1) සහ 8(2) වගන්ති සහ 1935 ඔක්තෝබර් 25 දිනැති අංක 8160 දරන ගැසට්පත්‍රය | විධායක වැටුප් ගෙවීම සඳහා අදාල වන සාමූහික ගිවිසුමේ පාර්ශවකරුවන් වී ඇති වෘත්තීය සමිති 6ක් නියමිත පරිදි වලංගු ලියාපදිංචියක් සහිත ක්‍රියාකාරී වෘත්තීය සමිති බවට කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි. | මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදුකර මේ සම්බන්ධයෙන් පැහැදිලි කරගැනීමට කටයුතු කරනු ලැබේ. | සාමූහික ගිවිසුමට එළඹීමට පෙර අදාල වෘත්තීය සමිති ක්‍රියාකාරී සහ වලංගු වෘත්තීය සමිති බවට කළමණාකරණය විසින් තහවුරු කරගත යුතුය. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත | සේවක අර්ථසාධක අරමුදලට බැර නොකරන ලද රු. 47,545.24 ක මුදලක් පසුගිය මූල්‍ය වර්ෂයේ සිට මේ වර්ෂය දක්වා ඉදිරියට ගෙනවිත් තිබුණි. | මෙම මුදල සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුත්තක් නොවේ. මීලඟ වර්ෂයේදී මෙම වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල | සේවක භාරකාර අරමුදලට බැර නොකරන ලද රු. 5,706.41 ක මුදලක් පසුගිය මූල්‍ය වර්ෂයේ සිට මේ වර්ෂය දක්වා ඉදිරියට ගෙනවිත් තිබුණි. | මෙම මුදල සේවක භාරකාර අරමුදලට ගෙවිය යුත්තක් නොවේ. මීලඟ වර්ෂයේදී මෙම වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.7** මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ ) | ආයතනය සතුව ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක රුපියල් 356,677 ක ශේෂයක් පවතින අතර මෙම බැංකු ගිණුම 2018 වර්ෂයේ සිට කිසිදු ක්‍රියාකාරී ගණුදෙනුවක් සඳහා භාවිතා කර නොමැත | මෙම ගිණුම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙනුවෙන් සපයනු ලබන සේවාව සඳහා ඇතිකරන ලද්දකි. ඉදිරියේදී මැනේජ්මන්ට සර්විසස් රක්ෂණ (පෞද්ගලික) සමාගම වෙත නව ගිණුම් නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කරන අතර එවිට මෙම ගිණුම මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කිරීමට අපේක්ෂිතයි. | මෙම බැංකු ගිණුම පවත්වාගෙන යාමේ අරමුණ නැවත සමාලෝචනය කර එම ගිණුම පවත්වාගෙනයාමට හෝ අවලංගු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| ආ | **2018** වර්ෂයේ රු. **1,000,000** ක වටිනාකමින් යුතු ස්ථාවර තැන්පතුවක් ආයතනය සතුව පවතින අතර **2020** දෙසැම්බර් **31** දිනට එහි ශේෂය රු.**1,213,750**කි. මෙම සමාගමේ අරමුණු සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය අනුව, මෙම ස්ථාවර තැන්පතුව පවත්වාගෙන යාමට සාධාරණ හේතුවක් ආයතනය සතුව නොතිබුනි. | මෙම ගිණුම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙනුවෙන් සපයනුලබන සේවාව සඳහා ඇතිකරන ලද්දකි. ඉදිරියේදී මැනේජ්මන්ට සර්විසස් රක්ෂණ පෞද්ගලික සමාගම වෙත නව ගිණුම් නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කරන අතර එවිට ගෙවීම් කටයුතු මෙම සමාගම මගින්ම සිදුකිරීමට සැලසුම් කරන බැවින් මෙම ගිණුම මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කිරීමට අපේක්ෂිතයි. | මෙම ස්ථාවර තැන්පතුව පවත්වාගෙන යාමේ අරමුණ නැවත සමාලෝචනය කර එම තැන්පතුව පවත්වාගෙන යාමට හෝ එහි මුදල් සමාගමට ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

**1.8** බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2020** ජනවාරි **01** දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සහ සේවා ගාස්තු අවලංගු කර තිබුණද සමාගම විසින් ගෙවිය යුතු ආර්ථික සහ සේවා ගාස්තු ශේෂය ලෙස රු. **1,940,901** සහ ලැබිය ආර්ථික සහ සේවා ගාස්තු ශේෂය ලෙස රු. **4,346,862**ක් **2020** දෙසැම්බර් **31** න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගිණුම් අතර සංසන්දනය නිම කිරීමෙන් පසු මෙම ශේෂ නිරවුල් කරනු ඇත. | සමාගම බදු නීතින්වල වෙනස්කම් වලට අනුකූලව කටයුතු කලයුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පෞද්ගලික) සමාගම විසින් දරනු ලබන සියලුම වියදම් සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සමාගම විසින් ප්‍රතිපූරණය කරනු ලබයි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා කිසිදු ලාභයක් හෝ අලාභයක් හඳුනාගැනීමේ අවශ්‍යතාවයක් නොමැත. සාංගමික ව්‍යවස්ථාවලිය අනුව පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගම ආරම්භ කර ඇත.

- රක්ෂණ කළමනාකරණය සහ තාක්ෂණික සේවා සැපයීම
- රක්ෂණ උපදේශන සේවා සැපයීම
- රක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන සේවා සැපයීම
- සාමාන්‍ය කළමනාකරණ සහ උපදේශන සේවා සැපයීම

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ගිණුම් අයිතමය | 2020 | 2019 | විචලනය | වර්ධනය/පසුබෑම |
|---|---|---|---|---|
| | රු . 000 | රු . 000 | රු . 000 | % |
| කළමනාකරණ ගාස්තු | 700,921.9 | 583,552.2 | 117,369.7 | 20% |
| වැටුප් | 293,089.6 | 244,766.5 | 48323.1 | 20% |
| සමස්ත සේවක මණ්ඩල වියදම | 693,751.2 | 573,958.8 | 119,792.4 | 21% |
| පාරිතෝෂික වෙන්කිරීම මත ආයුගණක ලාභය/(අලාභය) | (34355.6) | (33871.1) | (484.5) | 1% |
| පාරිතෝෂික වෙන් කිරීම | 175,732.0 | 117,737.6 | 57,994.4 | 49% |
| සේවක සංඛ්‍යාව | 80 | 70 | 10 | 14% |

## 2.3 අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | 2020 | 2019 |
|---|---|---|
| | රු . | රු . |
| එක් නිලධාරියකුගේ මාසික වියදම | 722,657.50 | 683,284.25 |
| සේවා මණ්ඩල වියදම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ දළ ලේඛනගත වාරික ආදායමේ (GWP) ප්‍රතිශතයක් ලෙස | 1.76% | 1.7% |
| සේවා මණ්ඩල වියදම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂික ශුද්ධ ලාභයේ ප්‍රතිශතයක් ලෙස | 11.98% | 8.17% |

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි | කාර්තුමය පදනමින් විගණනය සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ඇත | කාලීනව අභ්‍යන්තර විගණනයක් සිදුකිරීම. |